සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව

07 ශ්‍රේණිය කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
| --- |

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 05 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

01 පෘථිවි ආදර්ශ ගෝලයේ හරි මැදින් තිරස්ව පිහිටා ඇති රේඛාව ............................ වේ. (සමකය / ග්‍රිනිච් රේඛාව / අක්ෂාංශ)

02 උතුරු අක්ෂාංශ $90^{o}$ .......................................... වේ. (රේඛාවක් / ලක්ෂ්‍යයක් / වෘතයක්)

03 ලෝකයේ විශාලම කාන්තාරය වන සහරා කාන්තාරය ................................ මහාද්වීපයේ පිහිටා ඇත. (ආසියා / ඇමෙරිකා / අප්‍රිකා)

04 පෙන්ගුවින් හා සීල් මත්ස්‍යයින්ට වාසස්ථාන වන්නේ .................................. ප්‍රදේශයයි. (ඕස්ට්‍රේලියා / ග්‍රීන්ලන්ත / ඇන්ටාටිකා)

05 දකුණු අක්ෂාංශ $55^{o}$ රේඛාව ............................................. සාගරයේ උතුරු මායිම වේ. (ඉන්දියන් / දක්ෂිණ / පැසිපික්)

- අංක 06 10 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 ඇමෙරිකාවට හා යුරෝපයට මැදිව පිහිටා ඇති සාගරය පැසිපික් සාගරය වේ. ( )

07 22km ක ප්‍රදේශයක් ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශයට අයිතිය. ( )

08 ශ්‍රී ලංකාවේ උතුරු අක්ෂාංශ සීමාව $9^{o}.51^{/}$ වේ. ( )

09 ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 334 ක් ඇත. ( )

10 මෙට්‍රික් සිතියම්වල කළු පැහැති කඩ ඉරකින් අධිපාරවල් දක්වනු ලැබේ. ( )

- අංක 11 15 දක්වා වූ ප්‍රශ්නවල හිස්තැනට අදාළ වන නිවැරදි පිළිතුර ලියන්න.

11 සිතියම්වල භූමි ලක්ෂණ පෙන්වීම සඳහා, එක සමාන උස ඇති ස්ථාන යාකර අඳිනු ලබන ...................................................... භාවිතා කරනු ලැබේ.

12 කිරල හා ගිංපොල් වැනි ශාක ............................................................. ප්‍රදේශවල දැකිය හැකිය.

13 කඳුකර බිම් ප්‍රදේශවල ........................................................ ක්‍රමයට වී වගා කරනු දැකිය හැකිය.

14 ශ්‍රී ලංකාවට ....................................................... සිට මාර්තු දක්වා මාසවල සංචාරකයන් පැමිණීම බහුලය.

15 මුහුදට විවෘතව ගොඩබිම දෙසට විහිදී කරදිය පිරුණු මුහුදු ප්‍රදේශය ....................................... ලෙස හඳුන්වයි.

● අංක 16 20 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

16 මෙහි දැක්වෙන පිළිතුරුවලින් ශ්‍රී ලංකාවේ පිහිටි කලපු පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.

(1) වැලිගම, මීගමුව, කයිට්ස් (2) පුත්තලම, හලාවත, නන්දිකඩාල්

(3) දෙවුන්දර, කයිට්ස්, කහඳමෝදර (4) හලාවත, මීගමුව, ආරුගම

17 හේන් ගොවිතැන ආශ්‍රිතව පවතින විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) තෙත් කලාපයේ බහුලව දක්නට ලැබීම.

(2) වැව් මගින් ජලය සැපයීම.

(3) ධාන්‍ය වර්ග, එළවළු හා අලවර්ග වගා කිරීම.

(4) ගංවතුර අධික වීම.

18 1750 - 2000mm වැසි ලබන ශ්‍රී ලංකාවේ දේශගුණික කලාපය මින් කවරක් ද?

(1) කඳුරට තෙත් කලාපය (2) කඳුරට වියළි කලාපය

(3) පහතරට වියළි කලාපය (4) පහතරට තෙත් කලාපය

19 බලන කපොල්ල හමුවන්නේ මින් කවර මහා මාර්ගයක ගමන් කරන විටදැයි තෝරන්න.

(1) කොළඹ සිට මහනුවර මාර්ගය (2) මාතලේ සිට මහනුවර මාර්ගය

(3) කුරුණෑගල සිට මහනුවර මාර්ගය (4) බලංගොඩ සිට බණ්ඩාරවෙල මාර්ගය

20 ශ්‍රී ලංකාවේ දෙවන අඩතැනි කලාපයට අයත්වන සුවිශේෂී භූ ලක්ෂණය මින් කුමක් ද?

(1) සානු (2) කඳුවැටි (3) කපොලු (4) ශේෂ කඳු

(2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පවතින භූමි ලක්ෂණ ආශ්‍රිතව ඔබ සකස් කළ පැවරුම ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන කොටස් තුනෙහි පවතින භූ ලක්ෂණ 2 බැගින් ලියන්න.

1. මධ්‍යම කඳුකරය 2. වියළි කලාපය

3. වෙරළ ප්‍රදේශය (ල. 06)


(2) මධ්‍යම කඳුකර ප්‍රදේශයේ භූමි ලක්ෂණ අනුව සිදුවන මානව ක්‍රියාකාරකම් 2 ක් ලියන්න. (ල. 02)

(3) වියළි කලාපය ආශ්‍රිතව පවතින දේශගුණික ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

(4) වෙරළ ප්‍රදේශයේ පවතින කඩොලාන ශාක මගින් මිනිසාට ඇති ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 02)

(5) අනුරාධපුරය, නුවරඑළිය, හික්කඩුව, මන්නාරම යන නගරවලින් නගර දෙකක් තෝරාගෙන ඒවාහි පවතින ලක්ෂණ 2 බැගින් ලියන්න. (ල. 04)

02




(1) ඉහත දැක්වෙන මධ්‍යම කඳුකර සිතියමෙහි 1, 2, 3, 4, 5 යන අංකවලින් දැක්වෙන කඳු පංති නම් කරන්න. (ල. 05)

(2) A, B හා C වලින් දැක්වෙන සානු තුන නම් කරන්න. (ල. 03)

(3) A වලින් දැක්වෙන සානු කොටසට පිවිසීමට ඇති කපොලු 1 ක් හා අංක 3 න් දැක්වෙන කඳුවැටියේ සිට ගලා බසින ගංගා 2 ක් නම් කරන්න. (ල. 03)

03 පහත දැක්වෙන්නේ ලෝකයේ විවිධ ප්‍රදේශවල සිදුවන ස්වාභාවික ආපදා කීපයකි.


වාසුළි / ලැව්ගිනි / ගිනිකඳු / නායයාම / ගංවතුර
භූමිකම්පා / නියඟය / අකුණු කුණාටු

(1) ශ්‍රී ලංකාවට බහුලව බලපාන ස්වාභාවික ආපදා 4 ක් ඉහත කොටුවෙන් තෝරා ලියන්න. (ල. 04)

(2) ගංවතුර හා නියඟය නිසා සිදුවන බලපෑම් 2 ක් බැගින් ලියන්න. (ල. 04)

(3) එක් ස්වාභාවික ආපදාවක් තෝරා එමගින් ආරක්ෂාවීමට ගතයුතු ක්‍රියාමාර්ග 3 ක් දක්වන්න. (ල. 03)

04 ශ්‍රී ලංකාවට ක්‍රම දෙකක් මගින් වර්ෂාව ලැබෙන ස්වරූපය පහත ශ්‍රී ලංකා සිතියම් දෙකෙහි දක්වා ඇත. එහි සේයා කර ඇත්තේ වැඩි වැසි පතිතවන ප්‍රදේශයි.



1 2

(1) ඉහත 1 හා 2 ශ්‍රී ලංකා සිතියම් දෙකින් පෙන්වන වර්ෂාපතන ක්‍රම දෙක නම් කරන්න. (ල. 02)

(2) මින් වැඩි වැසි ලැබෙන්නේ කුමන ක්‍රමයෙන්දැයි දක්වා ඊට හේතු 2 ක් ලියන්න. (ල. 03)

(3) මෙම ක්‍රම දෙකට අමතරව වෙනත් වැසි ලැබෙන ක්‍රම 2 ක් දක්වන්න. (ල. 02)

(4) ලැබෙන වර්ෂාපතනය අනුව ශ්‍රී ලංකාව බෙදා දක්වෙන දේශගුණික කලාප 4 ක් දක්වන්න. (ල. 04)

05 (1) පහත සඳහන් ප්‍රකාශ සඳහා සුදුසු වාක්‍යය හෝ වචනය වරහන් තුළින් තෝරා ලියා දක්වන්න. (ල. 07)

(මහාද්වීපික තටකය / නාගරික ජනාවාස / තෙත් කලාපය / මධ්‍යම කඳුකරය / වියළි කලාපය / අර්ධ ශුෂ්ක කලාපය / හික්කඩුව වෙරළ තීරය)

1. මිලිමීටර 1250 ට වඩා වර්ෂාව අඩුය.
2. හේන් ගොවිතැන ප්‍රධාන වේ.
3. ජන සංඛ්‍යාවෙන් 60% ක් පමණ ජීවත් වේ.
4. තට්ටු නිවාස බහුලය.
5. කොරල්පර වර්ධනය වී ඇත.
6. මත්ස්‍ය ආහාර බහුලය.
7. තේ හා වාණිජ එළවළු වගාවට ප්‍රසිද්ධය.

(2) නාගරික ජනාවාසයක පවතින පහසුකම් දෙකක් හා නාගරික ප්‍රදේශයක ඇතිවන ගැටළු දෙකක් දක්වන්න. (ල. 04)

06 පහත දක්වා තිබෙන ලක්ෂණ මෙහි සඳහන් භූ දර්ශන වලින් කුමන ඒවාට අයත්දැයි දක්වන්න.

ලක්ෂණ පිදුරුතලාගල, ශේෂ කඳු, හැටන් සානුව, පුත්තලම් කලපුව, රම්බොඩ ඇල්ල, කලාවැව, හේන් වගාව, කඩොලාන ශාක, වාරිමාර්ග පද්ධති, සීනිගම දූපත, තේ වගාව

භූ දර්ශන මධ්‍යම කඳුකරය / වෙරළබඩ ප්‍රදේශ / අතරමැදි කලාපය (ල. 11)